# 2.23 ප්‍රවෘත්ති ජයාරූප ශිල්පයේ වෘත්තීයභාවය හා භාවිතය පිළිබඳ සන්නිවේදනාත්මක අධ්‍යයනයක්.

(මාධ්‍යවේදී සම්පත් ලක්මාල් ඝාතනය සම්බන්ධයෙන් දියත් කළ උද්ඝෝෂණ ව්‍යාපාරය පුවත්පත් වාර්තා කළ ආකාරය ආශ්‍රයෙනි.)

එස්.එච්.එස්.ප්‍රියදර්ශනී
ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

## ABSTRACT

ප්‍රවෘත්ති ඡායාරූප ශිල්පය යනු පුළුල් මහජන ප්‍රචාරණයක් සඳහා යම් සිදුවීමක් කැමරාවක් ආධාරයෙන් දෘශ්‍ය ලෙස පිටපත්කර ගැනීම ලෙස අර්ථ දැක්වේ. ඡායාරූපයක් සමග පහතින් දැක්වෙන කෙටි විස්තරය එක්වීමෙන් මවන පොදු අරුත ලිඛිත වාර්තාකරණයක වටිනාකමෙන් ඔබ්බට යයි. තාත්වික සහ යථාර්ථය පිළිබඳ කරුණු සැපයීමේ විශ්වාසවන්ත භාවයක් එමගින් ඡායාරූපයට හිමි වේ.

ප්‍රවෘත්ති ඡායරූප ශිල්පියාගේ වෘත්තීය භාවය හා භාවිතය එකිනෙකින් වෙනස් වේ. ශිල්පියාගේ වෘත්තීය භාවය යනු ඔහුගේ තාක්ෂණ දැනුම, උපකරණ හැකියාව, සහ ශිල්පීය නිපුනත්වය සහ අත්දැකීම් මත තීරණය වන්නකි. ඡායාරූපයක භාවිතය තීරණය වන්නේ ප්‍රකාශයට පත් වන මාධ්‍යය, එහි හිමිකාරීත්වය, කර්තෘ මණ්ඩල ප්‍රතිපත්තිය, යන කරුණු මූලික කොට ගනිමිනි. ඡායාරූපයක් බහාලන ස්ථානය, ප්‍රමාණය, වාර ගණන, රූප සම්පිණ්ඩනය අනුව එහි අර්ථකතනය වෙනස් වේ.

2006 ජූලි මස 2 වන දින සිදු වූ මාධ්‍යවේදී සම්පත් ලක්මාල් ද සිල්වා ඝාතනය මතවාද දැරීමේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳව දැඩි සමාජ අවධානයට යොමු වූ අවස්ථාවකි. ඔහුගේ ඝාතනය පිළිබඳව විරෝධය දැක්වීමටත්, එහි වගකිව යුත්තන් නීතිය හමුව පමුණුවන ලෙසත් බල කරන උද්ඝෝෂණයක් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඇතුළු මාධ්‍ය සංවිධාන පහක සංවිධානත්වයෙන් ජූලි 6 වන දින කොටුව දුම්රිය පොල ඉදිරිපිට දී පැවැත්වුණි.

ජනමාධ්‍ය වෘත්තියට සෘජු ලෙස සම්බන්ධ බැවින් පුවත්පත් ඡායාරූප ශිල්පීන්ගේත්, ජනමාධ්‍යවේදීන්ගේත් උපරිම අවධානය දිනාගත් එම අවස්ථාවට පුවත්පත් මාධ්‍යයේ ප්‍රමුඛ ඉඩක් හිමිවී තිබුණි. දිනපතා සහ සතිපතා පුවත්පත් 12 ක් කොළඹ කොටුව දුම්රිය පළ ඉදිරිපිට පැවති උද්ඝෝෂණය ආවරණය කර තිබූ අයුරු පිළිබඳ අන්තර් ගත විශ්ලේෂණයකි.

අන්තර්ගත විශ්ලේෂණය මගින් එකම පුවත්පත් ආයතනයක සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පත් මෙම සිදුවීම වාර්තා කර ඇති ආකාරය, විවිධතා, අම්මා යන පුද්ගල ප්‍රතිරූපය අලෙවි කිරීම යන ක්ෂේත්‍ර පිළිබඳව තුලනාත්මක විග්‍රහයක් සිදු කෙරේ.

ජනමාධ්‍ය, උද්ඝෝෂණයේ මුඛ්‍ය අරමුණ ඉස්මතු කිරීමෙන් ඔබ්බට ගිය සංවේදී ප්‍රවෘත්ති වාර්තාකරණයක් හඳුනාගත හැකිය.